පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක:2007/9

NCP/CS/PT/AP/03/21

2007.08.30

ආණ්ඩුකාරවර ලේකම්,
සියලුම අමාත්‍යංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>පොදු තැන්පත් ගිණුමේ ශේෂ නිරවුල් කිරීම.</u>**

උතුරු මැද පළාත් සභාවේ පළාත් අරමුදලට අදාළව පවත්වාගෙන යනු ලබන පොදු තැන්පත් ගිණුම් වල වර්ෂ 05 ට වඩා පැරණි නිරවුල් නොවූ ශේෂ පවතින බව විගණනය විසින් නිරන්තරයෙන් පෙන්වා දී ඇත. මෙසේ නිරවුල් නොවී ඇති ශේෂ පොදු තැන්පත් ගිණුමේ ඇති ඇප තැන්පත්, ටෙන්ඩර් තැන්පත්, විවිධ තැන්පත් හා වැන්දඹු අනත්දරු දායක මුදල් වලට අදාළ උපගිණුම් වලට අදාළ බැවින්, එසේ එක් එක් උප ගිණුම් වල ඇති පැරණි ශේෂ නිරවුල් කිරීම සඳහා මතු දැක්වෙන උපදෙස් නිකුත් කෙරේ.

**02. වැන්දඹු අනත්දරු දායක මුදල් වලට අදාළ උපගිණුම් වල ශේෂ.**

2.1 වැන්දඹු හා විශ්‍රාම වැටුප් දායක මුදල් සම්බන්ධව නිකුත් කර ඇති එන්සීපී/14/93 හා 1993.11.04 දිනැති පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛයෙන් 1993 වර්ෂය දක්වා රඳවාගත් දායක මුදල් චෙක්පතක් මගින් ආසන්නතම ප්‍රාදේශීය ලේකම් වෙත රාජ්‍ය ආදායමට බැර කිරීම සඳහා යවන ලෙස උපදෙස් දී ඇත.

2.2 අනතුරුව අංක එන්සීපී/6/94 හා 1994.08.11 දිනැති පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛය මගින් 1994 ජූලි මස 01 දින සිට අයකරනු ලබන දායක මුදල් පළාත් සභා පොදු තැන්පත් ගිණුමට බැරකර මාසික ගිණුම් සාරාංශය මගින් පළාත් භාණ්ඩාගාරය වෙත වාර්තා කරන ලෙසට උපදෙස් දී ඇත.

2.3 පසුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අංක 2001/1 චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව අවකරණය කරනු ලබන විශ්‍රාම වැටුප් දායක මුදල් 2004 මාර්තු මස සිට සෘජුවම චෙක්පතක් මගින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කරන ලෙසට මගේ අංක එන්සීපී/සීඑස්/පීටී/5 හා 2004.03.22 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත.

අනතුරුව මගේ අංක එන්සීපී/සීඑස්/පීටී/5/3/2005 හා 2005.02.22 දිනැති ලිපියේ අවසාන ඡේදය මගින් 2005 මාර්තු මාසයේ සිට අයකරගන්නා ලද අවකරණ, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක වෙත යැවීම සඳහා "ප්‍රධාන ලේකම්, උතුරු මැද පළාත" නමින් අණකරන ලද චෙක්පතක් මගින් පළාත් භාණ්ඩාගාරයට එවන ලෙසට උපදෙස් දී ඇත. මෙම උපදෙස් වලට අනුව අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් එවන ලද චෙක්පත් මවිසින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක වෙත යවනු ලබන අතර, එම ක්‍රියාවලිය මේ දක්වා අනුගමනය කරනු ලැබේ.

2.4 ඉහත සඳහන් පරිදි වරින් වර දෙන ලද උපදෙස්වලට අනුව වැන්දඹු අනත්දරු දායක මුදල් සම්බන්ධව කටයුතු කිරීමේදි ශේෂයක් පැවතිය හැක්කේ ඉහත 2.2 විස්තර කර ඇති පරිදි 1994 ජූලි මස 01 වෙනි දින සිට 2004 මාර්තු මස 01 වන දින දක්වා වූ කාලයට අදාලව බව නිරීක්ෂණය වේ. එම කාල වකවානුවට අදාල වැන්දඹු අනත්දරු දායක මුදල් මවිසින් පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයෙන් ලැබෙන අග්‍රිමයට හිලව් කර එම අමාත්‍යාංශය මගින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක වෙත යැවීමට කටයුතු කර ඇත. එසේ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක වෙත හිලව් කරන ලද ඔබ අමාත්‍යාංශයට /දෙපාර්තමේන්තුවනට අදාල වැන්දඹු අනත්දරු දායක මුදල් පිළිබඳ විස්තරයක් ඉතා ඉක්මනින් එවීමට කටයුතු කරමි. එනෙක් 1994 ජූලි මස 01 වන දින සිට 2004 මාර්තු මස 01 දින දක්වා කාලය තුළ අවකරණය කරන ලද පොදු තැන්පත් ගිණුමේ ඇති වැන්දඹු අනත්දරු දායක මුදල් ඔබේ පොදු තැන්පත් ගිණුමට හර කර 6000/0/0/0/8 වැන්දඹු අනත්දරු දායක මුදල් යනුවෙන් නව පොදු තැන්පත් ගිණුමක් ආරම්භ කර එම පොදු තැන්පත් ගිණුමට යථෝක්ත කාලයට අදාල මුදල් බැර කර ශේෂ නිරවුල් කර ගැනීමටත්, අනතුරුව එසේ නිරවුල් කරන ලද එක් එක් මාසයට අදාල මුදල මාසික ගිණුම් සාරාංශය සමඟ ඉදිරිපත් කිරීමටත් කරුණාකර කටයුතු කරන්න.

2.5 වැන්දඹු අනත්දරු දායක මුදල් සම්බන්ධව දැනට අනුගමනය කරන පරිපාටි කිසිදු වෙනසක් සිදුවී නැත.

**03. ඇප තැන්පත්, ටෙන්ඩර් තැන්පත්, විවිධ තැන්පත්**

3.1 ඇප තැන්පත් ටෙන්ඩර් තැන්පත් හා විවිධ තැන්පත් ගිණුම්වල ඇති වර්ෂ 02 ට වඩා පැරණි ශේෂ ඇත්නම් එම ශේෂ සම්බන්ධව මු.රෙ 570,571 සහ 572 ප්‍රකාරව ක්‍රියාකර නොපමාව නිරවුල් කරගැනීමට කරුණාකර කටයුතු කරන්න.

3.2 විවිධ තැන්පත් ගිණුම්වල වර්ෂය අවසානයේ දී භාණ්ඩාගාර උපදෙස් මත විශේෂ ව්‍යාපෘතිවලට අදාල මුදල් තැන්පත් කිරීම් තැබිය හැක. එවැනි මුදල් පොදු තැන්පත්

ගිණුම් වල දැනටත් ඇත්නම් සහ එය වර්ෂ 02 ට වඩා වැඩි නම්, එම ශේෂ ඔබේ පොදු තැන්පත් ගිණුම හර කර 6000/0/0/0/9 යනුවෙන් පළාත් භාණ්ඩාගාරයේ නව පොදු තැන්පත් ගිණුමක් ආරම්භ කර එම ශේෂ ඊට බැරකර මාසික ගිණුම් සාරාංශයෙන් වාර්තා කිරීමටත්, එසේ බැර කරන ලද ව්‍යාපෘති පිළිබඳ විස්තරයක් එවීමටත්, කරුණාකර කටයුතු කරන්න.

04. පොදු තැන්පත් ගිණුමේ නිරවුල් කිරීම් කටයුතු 2007.09.15 දින වන විට සම්පූර්ණයෙන් අවසාන විය යුතුය. මේ පිළිබඳව ඔබට යම් අපැහැදිලි තාවයක් ඇත්නම් 025-2222446 දුරකතන අංකයෙන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) හෝ 025-2234400 අංකයෙන් ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ ඇමතීමෙන් වැඩි විස්තර ලබා ගත හැකිය.



**ඒ.තලාකොටුනගේ,**
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.

පිටපත්:- 1. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව, අනුරාධපුර - දැ.පි
2. අධ්‍යක්ෂක, අභ්‍යන්තර විගණන හා විමර්ශන ඒකකය, අනුරාධපුර - දැ.පි